# ආගමන සමයේ තෙවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 61: 1–2, 10–11

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

**මම සමිඳාණන් කෙරෙහි බොහෝ ප්‍රීති වන්නෙමි.**

මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත. දිළිඳුන්ට සුභ අස්න දෙසීමට ද බිඳුණු සිත් ඇත්තන්ට සුව සෙත දීමට ද වහලුන්ට මිදීම දානය කරන්න ද සිරකරුවන්ට නිදහස දන්වන්න ද එතුමාණෝ මා ආලේප කළ සේක.

සමිඳුන්ගේ කරුණාවේ දවස, සතුරන්ට දඬුවම් දීමේ දවස පළ කරන පිණිස ද වැළපෙන සියල්ලන් සනසන පිණිස ද එතුමා මා ආලේප කළ සේක.

මම සමිඳුන් කෙරෙහි බොහෝ ප්‍රීති වන්නෙමි. මාගේ දෙවිඳුන් කෙරෙහි මම ප්‍රීතියෙන් පිනා යන්නෙමි. මනාලයකු මල් මාලාවක් දමා ගන්නාක් මෙන් ද මනාලිය ඇගේ ආභරණ පැළඳගන්නාක් මෙන් ද එතුමාණෝ ගැලවීම නමැති වස්ත්‍රය මට පළඳවන සේක. ධර්මිෂ්ඨකම නමැති සළුව මට හඳවන සේක.

පොළොව අළුත් පැළැටි උපදවන්නාක් මෙන් ද, උයන එහි වපුළ දේ ලියලවන්නාක් මෙන් ද මහෝත්තම සමිඳුන් වන දෙවිඳාණෝ ධර්මිෂ්ඨකම හා ප්‍රශංසාව සියලු ජාතීන් ඉදිරියේ හට ගන්වන සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ලූක් 1: 46–50, 53–55

**පිළිතුර:** මාගේ දෙවිඳුන් කෙරෙහි මම ප්‍රීතියෙන් පිනා යන්නෙමි.

**ගීය :** “මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි.
මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි.
මක්නිසා ද එතුමාණෝ සිය දාසිය ගේ දීනතාව
කුළුණු පාමින් සලකා වදාළ සේක.

හැම පරපුරක් ම මෙතැන් සිට
‘භාග්‍යවන්තිය’ යි මට කියනු ඇත.
පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක.
‘පරිශුද්ධයාණෝ’ යනු එතුමන්ගේ නාමය ය.
එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ,
පරපුරෙන් පරපුරට පැතිරේ.

සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා,
ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක.
අප පියවරුන් වූ ආබ්‍රහම් හා එම පරපුරට,
සදහට ම පොරොන්දු වූ දයාව සිහි කරමින්,
සිය සේවක ඉශ්රායෙල් සෙනග හට,
පිහිට වූ සේක.

## දෙවන දේව ප්‍රකාශනය 1 තෙසලෝනික 5: 16–24

*පාවුළු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.*

### ස්වාමින් වහන්සේගේ පුනරාගමනයේ දී ඔබ නිදොස්ව පවතින ලෙස ආරක්ෂා කරනු ලැබේවා.

නිතර ම ප්‍රීති වන්න. නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලෙහි දී ස්තුති දෙන්න. කිතුණුවන් වශයෙන් දෙවියන් වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ. ශුද්ධාත්මානුභාවයට අවහිර නොකරන්න. දිවැස් වැකි සුළු කොට නොතකන්න. සියල්ල විමසා බලා යහපත් දේ තදින් අල්ලා ගන්න. සියලු ආකාර නපුරෙන් වළකින්න. සාමදානයේ දෙවියන් වහන්සේ ම ඔබ මුළුමනින් ම පවිත්‍ර කරන සේක්වා. ඔබගේ මුළු ආත්මය ද ප්‍රාණය ද ශරීරය ද අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනයේ දී නිදොස් ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේවා! ඔබ කැඳවන තැනැන් වහන්සේ විශ්වාසවන්ත ය. උන් වහන්සේ එය ඉෂ්ට කරනු නියත ය.

*දේව වචනය මෙසේ ය*

## සුපුවත් ජය නද | යෙසායා 61: 1

ආලේලූයා! ආලේලූයා!
මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය
මා කෙරෙහි පිහිටා ඇත.
දිළිඳුන්ට සුභ අස්න දෙසීමට එතුමාණෝ
මා ආලේප කළ සේක.
ආලේලූයා!

## සුවිශේෂය | ජොහන් 1: 6–8, 19–28

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### මට අනතුරුව වඩින තැනැත් වහන්සේ ඔබ මැද සිටින සේක.

දෙවියන් වහන්සේ එවා වදාළ මනුෂ්‍යයෙක් වි ය. ඔහුගේ නම ජොහාන් ය. ඔහු පැමිණියේ, තමා මගින් සියළු දෙනා අදහා ගන්නා පිණිස ආලෝකය ගැන සාක්ෂි දැරීමට, සාක්ෂිකරුවෙකු වශයෙනි. ඔහු ඒ ආලෝකය නොව, ඒ ආලෝකය ගැන සාක්ෂි දරණ පිණිස ආ තැනැත්තේ ය.

'ඔබ කවරෙක්දැ' යි අසන පිණිස ජුදෙව්වරුන් විසින් ජෙරුසලෙමෙන් පූජකයන් ද, ලෙවියයන් ද යැවූ කල ජොහාන් සාක්ෂි දෙමින්, "මම ක්‍රිස්තුස් නොවෙමි" යි නොසඟවාම ප්‍රකාශ කළේ ය. "එසේනම් කිමෙක්ද? ඔබ එළියා දැ" යි ඔව්හු ඇසූහ. "නැතැ" යි ඔහු කීය. "ඔබ ඒ දිවැසිවරයා ද?" යන ප්‍රශ්නයටත් "නැතැ" යි ඔහු කීය. "එසේ නම් ඔබ කවරෙක් ද? අප එවූ අයට පිළිතුරක් දිය යුතු යි! ඔබ ගැනම ඔබ කියන්නේ කිමෙක්දැ" යි ඔවුහු ඇසූහ.

"මම නම් යෙසායා දිවැසිවරයා කී පරිදි, 'සමිඳාණන්ගේ මඟ පිළියෙළ කරන්නැ' යි පාළුකරයෙහි මොරගසන්නකුගේ හඬ වෙමි" යි ජොහන් පිළිතුරු

දුනි. එවන ලද සමහරෙක් පරිසිවරු ය. ඔව්හු ප්‍රශ්න කරමින් “ඉදින් ඔබ ක්‍රිස්තුන් වත්, එළියා වත්, ඒ දිවැසිවරයා වත් නොවන්නෙහි නම්, බෞතීස්ම–ස්නාපනය කරන්නේ කුමක් නිසාදැ” යි ඇසූ හ. ජොහන්ද පිළිතුරු දෙමින්, “මම වතුරෙන් බෞතීස්ම–ස්නාපනය කරමි. එහෙත් ඔබ නාඳුනන කෙනෙක් ඔබ මැද වැඩ සිටිති. එනම්, මට පසුව වඩින තැනැත් වහන්සේ ය. උන් වහන්සේගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි” යි කී ය. මෙය සිදු වූයේ, ජොහාන් බෞතීස්ම ස්නාපනය කරමින් සිටි ජොර්දානෙන් එතෙර බෙතානියේ දී ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*